# අධ්‍යාපන අමාත්‍යාංශය - කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව

'සිසු ගුරු නැණ පවුර' සම්මන්ත්‍රණ මාලාව

අ.පො.ස. ( උ.පෙළ) විභාගය - 2024 සඳහා පෙරහුරු ප්‍රශ්න පත්‍රය

| ජෛව පද්ධති තාක්ෂණවේදය II | 66 | S | II | පැය තුනයි |
|---|---|---|---|---|

විභාග අංකය :..........................

උපදෙස් :

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 12 කින් සහ ප්‍රශ්න 10 කින් සමන්විත වේ.
- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත වන අතර කොටස් **දෙකටම** නියමිත කාලය **පැය තුනකි**.

A කොටස - ව්‍යුහගත රචනා (පිටු අංක 02 - 10)

- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- ඔබේ පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මෙම ඉඩ ප්‍රමාණය පිලිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු **නොවන** බව ද සලකන්න.

B කොටස - රචනා (පිටු අංක 11 - 12)

- ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු A සහ B කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ A කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
- ප්‍රශ්න පත්‍රයේ B කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |
| ප්‍රතිශතය | | |

අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

සංකේත අංකය

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය | |

[දෙවැනි පිටුව බලන්න]

**A - කොටස - ව්‍යුහගත රචනා**

**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.

**01.** A. එකම කුළුණක කාලගුණ උපාංග සවි කර ඇති, ස්වයංක්‍රීය කාලගුණික මධ්‍යස්ථානයක (Automated weather Station - AWS) රූප සටහනක් මෙහි දැක්වේ.




1. මෙහි , A, B, C, D, E උපකරණ නම් කරන්න.
   A- ……………………………………………………………………………
   B- ……………………………………………………………………………
   C- ……………………………………………………………………………
   D- ……………………………………………………………………………
   E- ……………………………………………………………………………

2. D හි ප්‍රයෝජනයක් ලියන්න.
   ……………………………………………………………………………………

B. ශ්‍රී ලංකාවේ ප්‍රධාන පස් කාණ්ඩ පිළිබඳ පහත දක්වා ඇති වාක්‍යවල යටින් ඉරි ඇඳි සදොස් තැන් නිදොස් කොට ලියන්න.

1. ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් වැඩිම වපසරියක පැතිර පවතින පස <u>රතු- කහ පොඩ්සොලික්</u> පස වේ.
   ……………………………………………………………………………………
2. <u>අතරමැදි</u> කලාපයේ පවතින අධික වර්ෂාපතනය නිසා රතු-කහ පොඩ්සොලික් පසෙහි කැටායන ක්ෂරණයට ලක් වී පසේ pH අගය අඩු වේ.
   ……………………………………………………………………………………
3. අඩ හියුමික් ග්ලේ පසෙහි දුර්වල ජලවහනයක් පවතින බැවින් පසෙහි වර්ණය <u>කළු</u> පැහැයක් ගනියි.
   ……………………………………………………………………………………
4. රතු දුඹුරු ලැටසොලික් පසෙහි භෂ්ම සංතෘප්තිය ඉහළ අතර ප්‍රධානතම කැටායනයක් ලෙස <u>සෝඩියම්</u> පවතින බැවින් කොකෝවා වගාවට සුදුසු ය
   ……………………………………………………………………………………
5. දියළු පසෙහි ලක්ෂණවල අධික විචලතාවයක් පවතින අතර, <u>කබොක් ගල් කර්මාන්තය</u> උදෙසා බහුලව යොදා ගත හැකි ය
   ……………………………………………………………………………………

C. 1. වක්‍ර සමෝච්ඡකරණයේ දී යොදා ගත් ග්‍රිඩ් සටහනක කොටසක් පහත දැක්වේ. එහි ශීර්ෂවල උන්නතාංශය සඳහන් කර ඇත. අන්තර් නිවේෂණය කිරීම මගින් 99 mක් වන හා 100 mක් වන සමෝච්ඡ රේඛා ඇඳ දක්වන්න.



2. අනෙකුත් බිම් මැනුම් ක්‍රමවලට සාපේක්ෂව තල මේස මිනිතයේ දී ඇති ප්‍රධානතම වාසිය කුමක් ද?

..........................................................................................................................................

..........................................................................................................................................

3. තල මේසය තෙපාව ලඹකරුව හා ලඹයට අමතරව තලමේස මිනිතය සඳහා අවශ්‍ය වඩාත් වැදගත් උපකරණ **තුනක්** සඳහන් කරන්න.

i. ..........................................................................................................................................

ii. ..........................................................................................................................................

iii. ..........................................................................................................................................

D. භූගත ජලය පිළිබඳව පහත දැක්වෙන වගන්තිවල ගැලපෙන නිවැරදි පදය වරහන් තුළින් තෝරා පැහැදිලිව යටින් ඉරක් අඳින්න.

1. භූගත ජලයේ පැවතීම කෙරෙහි පාංශු (සච්ඡිද්‍රතාව/ උෂ්ණත්වය/ වර්ණය) ප්‍රධාන වශයෙන් බලපාන සාධකයකි.

2. ඉහළ හා පහල සීමා වූ ස්ථරවලින්, ඉහළ ස්ථරය අර්ධ පාරගම්‍ය වන ලෙස සැකසී ඇති ජලධරය (අනවහිර/ සීමා වූ/ කාන්දු වන) ජලධරයක් ලෙස හඳුන්ව යි

3. වර්ෂා ජලය මඟින් භූගත ජලය පුනරාරෝපණය වන විට එය (අනියම්/ ස්ථානීය/ කේන්ද්‍රීය) පුනරාරෝපණය ලෙස නම් කරයි

4. භූගත ජලය  පුනරාරෝපණය වැඩි දියුණු කර ගැනීමට, ශාක වගාව මඟින් (මතුපිට අපදාවය/ කාන්දු වීම/ වැස්සීම) අවම කර ගැනීම වැදගත් වේ

E. තරුණ ව්‍යවසායකයෙක් සතු කිරි ආහාර සැකසුම් මධ්‍යස්ථානයක පැස්ටරීකෘත කිරි, කල් කිරි හා යෝගට් නිෂ්පාදනය සිදු කරනු ලැබේ. එම නිෂ්පාදන ක්‍රියාවලි ඇසුරින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. ඉහතකිරි ආශ්‍රිත ඉහත නිෂ්පාදන ඇසුරුම් කිරීමේ දී යොදා ගන්නා වීදුරු හා ප්ලාස්ටික් ඇසුරුම් ජීවානුහරණයේ දී පහත අවස්ථා සිදු කරන ආකාරය සඳහන් කරන්න.

a. වීදුරු බෝතල් පිරිසිඳු කිරීම - ……………………………………………………...

b. බෝතල් මූඩි පිරිසිඳු කිරීම - ..........................................................................

c. වීදුරු බෝතල් ජීවානුහරණය - ……………………………………………………...

d. බෝතල් මූඩි ජීවානුහරණය - ……………………………………………………...

e. ප්ලාස්ටික් යෝගට් බඳුන් පිරිසිඳු කිරීම - ……………………………………………………...

2. නිෂ්පාදන ක්‍රියාවලියේ පහත තත්ත්ව සිදු කිරීමේ අවශ්‍යතාව සඳහන් කරන්න.

1. වීදුරු බෝතලයට කිරි පිරවීමේ දී බෝතල් කටේ සිට 2.5cm පමණ ඉඩ තැබීම

…………………………………………………………………………………………...

…………………………………………………………………………………………...

2. පීඩන තාපකයෙන් ඉවතට ගත් කල්කිරි බෝතල් නිවුන පසු සෝඩියම් මෙටාබයි සල්ෆයිට් (SMS) ද්‍රාවණයකින් සේදීම

..........................................................................................................................................

..……………………………………………………………………………………………

**02.** A. විවිධ අරමුණු සඳහා ජලය භාවිතයේ දී ගුණාත්මක බව පවත්වා ගැනීම ඉතා වැදගත්වේ. ජලයේ ගුණාත්මක බව සම්බන්ධ පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර වරහන් අතරින් තෝරා ලියන්න.

i. ................................ ජලය රසායනික සංයෝගයක් වුවත්, එය ස්වාභාවිකව හමු නොවන්නේ, ජලය ඉතා හොඳ ................................ වීම නිසාය.

ii. ජලයේ ගුණාත්මක බව මැනීමේ දී යොදා ගන්නා විවිධ ................................ මඟින්, එම ජලය භාවිතයට අදාළ ව ........................................... විස්තර කර ඇත.

iii. විකල්ප බල ශක්ති ප්‍රභවයක් ලෙස යොදා ගන්නා  විවිධ ..................................ශක්තිය  මඟින් ජලයට ............................ දූෂක එක් විය හැකි ය.

iv. කාර්මික අපද්‍රව්‍ය පවිත්‍රකරණයේ දී, එම ජලයේ අඩංගු .............................. ඉවත් කිරීම සඳහා .......................... යොදාත හැකි ය.

(සක්‍රීය කාබන්, පරාමිති, විකිරණශීලී, ද්‍රාවකයක්,බැර ලෝහ, නබරීකාරක, සංශුද්ධ, න්‍යෂ්ටික, තත්ත්ව ප්‍රමිති, ද්‍රාව්‍යයක්)

B. 1. වාණිජ පැළ තවාන් සඳහා වඩා සුදුසු තවාන් වර්ගය කුමක් ද ?

…………………………………………………………………………………………

2. තවානක රෝපණ ද්‍රව්‍ය සිටුවා ගැනීමේ වාසි දෙකක් සඳහන් කරන්න.

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

C. විසිතුරු මසුන් සඳහා අජීවී ආහාර මෙන්ම ජීවී ආහාර ද ලබා දීම සිදු කරන අතර ආර්ටීමියා නෝප්ලියාවන් ජීවී ආහාර ලෙස යොදා ගන්නා වැදගත් සංඝටකයකි .

1. ආර්ටීමියා නෝප්ලියාවන්ගේ කායික ලක්ෂණයක් ලියන්න.

……………………………………………………………………………………………...…
.

2. ඉහත සඳහන් ජීවී ආහාරය විසිතුරු මත්ස්‍යයින් සඳහා ආහාරයක් ලෙස යොදා ගන්නේ නම් එහි ප්‍රධාන අවාසිය කුමක්ද?

.......................................................................................................................................................

.......................................................................................................................................................

D. 1. විවිධාංගීකරණය කරන ලද මාංශමය නිෂ්පාදනයක් වන සොසේජස් පිළිබඳ පහත ප්‍රකාශවල සත්‍ය අසත්‍ය බව සඳහන් කරන්න.

a) අමුද්‍රව්‍ය මිශ්‍ර කිරීමේ දී හා මස් ඇඹරීමේ දී උෂ්ණත්වය ඉහළ යෑම පාලනය සඳහා ලුණු එකතු කරනු ලැබේ. (සත්‍යය වේ / අසත්‍යය වේ).

b) සකස් කරන ලද සොසේජස් පිසීමට පෙර දුම් ගැසීම මගින් රසය හා වර්ණය දියුණු වේ. ( සත්‍ය වේ / අසත්‍ය වේ).

c) සොසේජස් සඳහා මස් පදම් කිරීමට යොදා ගනු ලබන්නෙ සෝඩියම් සිට්‍රේට් ය. ( සත්‍ය වේ / අසත්‍ය වේ).

d) සොසේජස් පිසීමේ දී සොසේජස් කරලේ අභ්‍යන්තර උෂ්ණත්වය 70 ℃ විය යුතු අතර, බාහිර උෂ්ණත්වය 80 ℃ ක් විය යුතු ය. ( සත්‍ය වේ / අසත්‍ය වේ).

2. පහත දැක්වෙන A, B, C හා D රසායන ද්‍රව්‍ය භාවිත කරමින් කිරි අපමිශ්‍රණය වී ඇති ද්‍රව්‍ය හඳුනා ගත හැකි ය. එම රසායන ද්‍රව්‍ය මගින් හඳුනාගත හැකි අපමිශ්‍රිත ද්‍රව්‍යය බැගින් ලියන්න.

a) පොටෑසියම් ඩයික්‍රෝමේට් ..............................................................
b) 1% අයඩීන් ද්‍රාවණය ..............................................................
c) රෙසොසිනෝල් ..............................................................
d) සිල්වර් නයිට්‍රේට් ..............................................................

E. වීවල පිරුණු ධාන්‍ය අස්වැන්න පිළිබඳ ව පහත වගන්තිවල සත්‍ය (T) / අසත්‍ය ( F) බව සඳහන් කරන්න.

a) පිරුණු ඇට සහිත සහල් අස්වනු ප්‍රතිශතය පිරිසිදු කරන ලද වී කිලෝවකට සාපේක්ෂව ගණනය කරයි. ☐

b) දියුණු රටව, වී සඳහා මිල තීරණය කිරීමේ දී පිරුණු ඇට සහිත සහල් අස්වනු ප්‍රතිශතය යොදා ගනියි. ☐

c) පිරුණු සහල් ඇට ප්‍රතිශතය ගණනයේ දී සම්පූර්ණ සහල් ඇට මෙන්ම 20- 25 % ක් පමණ කැඩුණු සහල් ඇට ද සලකනු ලබයි. ☐

d) වීවල පසු අස්වනු ක්‍රියාකාරකම් යනු , වී අස්වනු නෙළීමේ සිට සහල් සැකසීම දක්වා ක්‍රියාකාරකම් වේ. ☐

e) වීවල ප්‍රධානතම පසු අස්වනු ක්‍රියාකාරකම් වන්නේකොළ මැඩීම හා පිරිසිදු කිරීම යි. ☐

F. ශිෂ්‍යයෙක් උසස් පෙළ විභාගයෙන් පසුව, සෙවණ ගෘහයක් තුළ ඇන්තූරියම් වගාවක් ආරම්භ කිරීමට අදහස් කරයි.

1. ඒ සඳහා සෙවණ දැල මිලදී ගැනීමේ දී ඔහු සැලකිලිමත්විය යුතු , සෙවණ දැලෙහි තිබිය යුතු ප්‍රධාන ගුණාංග තුනක් සඳහන් කරන්න.
   1.........................................................................................................................................
   2.........................................................................................................................................
   3.........................................................................................................................................

2. එම සෙවණ ගෘහය තුළ දිලීර ඇතිවීම වළක්වා ගැනීම සඳහා ගත හැකි පූර්ව ක්‍රියාමාර්ග 2ක් සඳහන් කරන්න.
   1.........................................................................................................................................
   2.........................................................................................................................................

3. ඇන්තූරියම් වගාව සඳහා වගා මාධ්‍යයක් තේරීමේ දී, එම මාධ්‍යයෙහි තිබිය යුතු ප්‍රධාන ගුණාංග දෙකක් සඳහන් කරන්න.
   1.........................................................................................................................................
   2.........................................................................................................................................

**03.** A. විද්‍යුත් පරිපථයක ධාරාව ගලා යෑමට ඇති බාධකය ප්‍රතිරෝධය ලෙස හඳුන්වයි.

1. විද්‍යුත් පරිපථ සැකසීමේ දී භාවිත වන ප්‍රතිරෝධක වර්ග තුනක් පහත දැක්වේ. ඒවා හඳුනාගෙන නම් කර, පරිපථ සංකේත ඇඳ දක්වන්න.

| රූපය | ප්‍රතිරෝධක වර්ගය | පරිපථ සංකේතය |
|---|---|---|
|  | ........................................................ | |
| B.  | ..................................................... | |
| C.  | ..................................................... | |

2. C රූපයට අදාළ ප්‍රතිරෝධකයෙහි ප්‍රතිරෝධක අගය ලියා දක්වන්න.

.........................................................................................................

3. සංඛ්‍යාංක මල්ටිමීටරයක් භාවිත කර පරිපථයකට සවි කළ ප්‍රතිරෝධක අගය මැනීමේ පියවර පහත දක්වා ඇත. එහි i හා ii පියවර නම් කරන්න.

i .........................................................................................................

↓

මල්ටිමීටරයේ රොටරි ස්විච්චිය ඕම් ( Ω ) පරිමාණයට සැකසීම

↓

කලු පැහැති (-) ඉලෙක්ට්‍රෝඩය "COM"අග්‍රයට ද රතු පැහැති (+)ඉලෙක්ට්‍රෝඩය "Ω" ලෙස සඳහන් අග්‍රයට ද සවි කිරීම

↓

ii. .........................................................................................................

↓

ප්‍රතිරෝධක අගය කියවා ගැනීම

4. අඳුරේ දී ස්වයංක්‍රීයව දැල්වෙන විදුලි පහනක් නිර්මාණය කිරීමේ දී භාවිත වන පහත දැක්වෙන සංවේදක පරිපථය ආඩිනෝ පුවරුවට සම්බන්ධ කොට දක්වන්න.



සංවේදක පරිපථය




ආඩිනෝ පුවරුව

B. විසිතුරු පුෂ්ප හා පත්‍ර වෘන්තවලට ප්‍රතිකාර කිරීමට යොදන රසායන ද්‍රව්‍ය පිළිබඳ පහත වගන්තිවල හිස්තැනට යෙදිය යුතු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

1. විසිතුරු පත්‍රිකාවල වෘන්ත කැපූ සැනින් ඒවා යොදන ද්‍රාවණයේ උණුසුම් ජලය හා ග්ලිසරීන් අනුපාතය ......................... (1:1/ 1:2) වේ.

2. කපන ලද රෝස පුෂ්ප වෘන්ත ගිල්වීම සඳහා සකසා ගන්නා ද්‍රාවණයේ pH අගය ...................... (3.5/ 4.5) වේ.

3. බැක්ටීරියා පාලනය සඳහා ප්‍රතිකාරක ද්‍රාවණයට ............................($AgNO_3$ / $CUSO_4$) යොදා ගත හැකි ය.

4. පත්‍ර හෝ පුෂ්ප වෘන්තවල ස්වසන ශීඝ්‍රතාව අඩු කිරීමට ........................................................................ (බෙන්සයිල්ඇඩිනින්)/ සිල්වර්තයෝසල්ෆේට්) ද්‍රාවණ භාවිත කරයි.

C. පහත දැක්වෙන කැපුම් මල් හා විසිතුරු පත්‍රික ශාක ප්‍රචාරණය සඳහා බහුලවම යොදා ගන්නා ක්‍රමය සඳහන් කරන්න.

1. රෝස -
……………………………………………………………………………………
2. ඇන්තූරියම් -
……………………………………………………………………………………
3. ඕකිඩ් -
……………………………………………………………………………………
4. කැලතියා -
……………………………………………………………………………………
5. බිගෝනියා -
……………………………………………………………………………………
6. ඩ්‍රැසීනා -
……………………………………………………………………………………

D. පිවිතුරු නිෂ්පාදන ක්‍රියාවලියට අදාල පියවර කිහිපයක් හා එම පියවරවලට අදාළ විස්තර කිහිපයක් පහත දැක්වේ. එම පියවරවට අදාළ විස්තරය නිවැරදිව ගලපන්න.

**පියවර**

1. පරිභෝජනය පිළිබඳ විස්තර තබා ගැනීම ☐
2. දර්ශක භාවිතය හා පාලනය කිරීම ☐
3. අමුද්‍රව්‍ය හා අතිරේක අමුද්‍රව්‍ය ආදේශනය කිරීම ☐
4. ස්වයංක්‍රීයකරණය කිරීම ☐

**විස්තරය**

P) බලශක්තිය සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රභව යොදා ගැනීම
Q) ශ්‍රම හිඟයට පිළියම් යෙදීමට හා පුද්ගල දෝෂ අවම කිරීමට යොදා ගැනීම

R) Sankey රූපසටහන් මඟින් විශ්ලේෂණය සිදු කිරීම

S) සැලසුම් කිරීමේ හා පුහුණු කිරීමේ දුර්වලතා පිළිබඳ දැන ගැනීමට යොදා ගැනීම

E. “ආහාර බෝගවලින් ගෙවතු වගාව” යනු වර්තමානයේ ප්‍රචලිත භූමි අලංකරණ සංකල්පයකි.

1. ආහාර බෝග මඟින් ගෙවතු අලංකරණය සිදු කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.
…………………………………………………………………………………………………
…………………………………………………………………………………………………

2. මෙවැනි ගෙවතු වගාවලදී පළිබෝධ මර්ධනයට, ජෛව හායනයට ලක්වන පළිබෝධනාශක හා පොහොර ලෙස ජෛව පොහොර යොදා ගැනේ. ඒ එක එකක් සඳහා උදාහරණයක් බැගින් දෙන්න.
   a) ජෛව හායනයට ලක්වන පළිබෝධනාශක - ..................................................................
   b) ජෛව පොහොර - ..................................................................

**04.** A. පහත දක්වා ඇත්තේ සිව්රෝද ට්‍රැක්ටරයක බල සම්ප්‍රේෂණ පද්ධතියට අදාළ කොටසකි.




1. A හා B ලෙස දක්වා ඇත්තේ කලචය (Clutch) ට අදාළ කොටස් දෙකකි. A හා B නම් කරන්න.
   1. ක්ලචය - …………………………………………………………………………………
   2. ගියර් පෙට්ටය …………………………………………………………………………………

2. ක්ලචයේ හා ගියර් පෙට්ටයේ කාර්ය භාරය සඳහන් කරන්න.
   1. ක්ලචය - …………………………………………………………………………………
   2. ගියර් පෙට්ටය …………………………………………………………………………………

3. C, D, E හා F අතරින් පළමු ගියරය (1st Gear ) සහ පසුපසට ධාවනය වන ගියරය (Reverse Gear) තෝරා ලියන්න.
   i. පළමු ගියරය - ………………………………………………………………
   ii. පසුපසට ධාවනය කරන ගියරය - ……………………………………………………………...

B. අත් ආනතිමානය හා තනිරිටි ක්‍රමය භාවිත කර හිටි ගසක උස මනින අවස්ථාවන්ට අදාළ රූප සටහන් දෙකක් පහත දක්වා ඇත. එම රූප සටහන්වල දී ඇති දත්ත ඇසුරින්,ඒ එක් එක් අවස්ථාවලදී ගසෙහි උස මැන ගැනීම සඳහා යොදා ගත හැකි ප්‍රකාශ දෙකක් ගොඩ නගන්න.

1.

…..  ………………


2.

 ………………………………………………………………

C. ලංකාවේ බහුලවම රැස් කරන ශාක ශ්‍රාවයක් ලෙස රබර් කිරි සැලකිය හැකි ය. ඒ පිළිබඳව පහත දක්වා ඇති ඡේදයේ හිස්තැන් ගැලපෙන අයුරින් පුරවන්න.

රබර් කිරි කැපීම ආරම්භයේ දී, ගසේ වට ප්‍රමාණය .........................ට වඩා වැඩි විය යුතු ය. කඳේ පොළවේ සිට ................................ක් උසින් .........................ක ආනතියක් සහිතව .................................. පටකය දක්වා කැපුමක් යොදන අතර, එය කඳේ වට ප්‍රමාණයෙන් ................................... ක් පමණ දුරට සිදු කරයි. කිරි කැපීම .................................. කාලයේ සිදු කිරීම මඟින් වැඩි කිරි අස්වැන්නක් ලබා ගත හැකි ය.

(50 cm , උදෑසන, බාගයක්, $45^0$, සන්ධ්‍යා, ප්ලෝයම, 60 cm, කැම්බියම, 120 cm, කාලක්, 130 cm, $30^0$, හතරෙන් තුනක් )

D. වර්තමානයේ ශ්‍රී ලංකාව ද අපනයන වෙළෙඳපොළ සඳහා ගම්මිරිස් ඉදිරිපත් කරන ලොව ප්‍රමුඛ රටකි .ගම්මිරිස් , සුදු ගම්මිරිස් හා කළු ගම්මිරිස් ලෙස ගම්මිරිස් ප්‍රධාන ආකාර 2කි.

1. කළු ගම්මිරිස් නිෂ්පාදන ක්‍රියාවලියේ දී උණුදිය ප්‍රතිකාර කිරීමේ අරමුණු 2ක් ලියන්න.
   1.........................................................................................................................
   2.........................................................................................................................
2. කළු ගම්මිරිස් වියලූ පසු එහි අවසාන තෙතමන ප්‍රමාණය සඳහන් කරන්න.
   .........................................................................................................................
3. වියළීම සඳහා භාවිත කරන කෘත්‍රිම වියළන ක්‍රම 2ක් සඳහන් කරන්න.
   1.........................................................................................................................
   2.........................................................................................................................
4. සුදු ගම්මිරිස් සෑදීමේ දී සිට්‍රික් අම්ල ප්‍රතිකාරය කිරීමේ අරමුණ සඳහන් කරන්න.
   .........................................................................................................................

E. ආපදා වැළැක්වීමේ ධූරාවලිය මඟින් ආපදා හා ඒවායේ අවදානම් තත්ත්ව හඳුනා ගැනීමෙන් එම තත්ත්ව වළක්වා ගැනීමට යොදන ක්‍රමවේද පෙන්වා දී ඇත. පහත දක්වා ඇත්තේ පාලන ක්‍රියාමාර්ග හා එයට අදාළ නිදසුන් කිහිපයකි. ඒවා නිවැරදි අයුරින් ගලපන්න.

| ආපදා පාලන ක්‍රියාමාර්ගය | | ආපදා පාලනය සඳහා නිදසුන් |
|---|---|---|
| 1. ජෛව ආපදා පාලනය කිරීම සඳහා ඉවත් කිරීම සිට | ☐ | A උස මිටක් සවි කළ රෝලර් එකක් මඟින් බිම තීන්ත ගෑම |
| 2. භෞතික ආපදා පාලනය සඳහා ආදේශන යෙදවීම | ☐ | B රසායන ද්‍රව්‍ය ගබඩා කාමර සඳහා පිටකුරු පංකා සවි කිරීම |
| 3. රසායනික ආපදා පාලනය සඳහා ඉංජිනේරුමය ක්‍රියාමාර්ග ගැනීම | ☐ | C සේවකයින් සඳහා වැඩ මාරු ක්‍රම හඳුන්වා දීම |
| 4. ජෛවීය ආපදා පාලනය සඳහා පුද්ගල ආරක්ෂණ උපකරණ භාවිත කිරීම | ☐ | D ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා දීම |
| 5. ශ්‍රම ආපදා පාලනයට පරිපාලනමය ක්‍රියාමාර්ග ගැනීම | ☐ | E බෝවන රෝග පාලනය සඳහා අත් හා මුඛ ආවරණ භාවිතය |

F. ව්‍යවසායකත්වය පිළිබඳ පහත ප්‍රකාශවල නිවැරදි (√) හා වැරදි (x) බව දක්වන්න.

| ප්‍රකාශ | නිවැරදි (√) හා වැරදි (x) බව |
|---|---|
| 1. සාර්ථක මෙහෙයවීමක් සඳහා නායකත්වය හා සන්නිවේදන කුසලතා පමණක් ප්‍රමාණවත් ය. | ☐ |
| 2. ව්‍යාපාරයක් ආරම්භයේ දී හා පවත්වාගෙන යාමේ දී කාර්යක්ෂම කර ගැනීමට සහය වන සේවා උපකාරක සේවා නම් වේ. | ☐ |
| 3. ක්ෂුද්‍ර ණය පහසුකම් ලබා දීම මඟින් විශාල ණයක් ලබා ගැනීමට අපහසු කුඩා ව්‍යවසායකයින්ට වාසි සැලසේ. | ☐ |
| 4. ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම, ව්‍යාපාරයක් ආරම්භයට හා පවත්වාගෙන යාමට වැදගත්වන ප්‍රධාන නීති රෙගුලාසිය කි. | ☐ |